කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි පළමු පරීක්ෂණය (බාහිර) - 2024

අප්‍රේල්/ මැයි - 2026

# BMGTE 1025 – ව්‍යාපාර ගිණුම්කරණය

ප්‍රශ්න සංඛ්‍යාව : පහයි (05) යි | කාලය පැය: 03 යි

සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

වැඩසටහන්ගත නොකළ ගණකයන්ත්‍ර පමණක් භාවිතා කළ හැකිය.

**ප්‍රශ්න අංක 01**

අ) මූල්‍ය ගිණුම්කරණය සහ කළමනාකරණ ගිණුම්කරණය අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 02)

ආ) අඛණ්ඩ පැවැත්ම මූලධර්මයෙ වැදගත්කම සාකච්ඡා කර එය මූල්‍ය වාර්තාකරණයට බලපාන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 02)

ඇ) පහත සඳහන් අවස්ථාවන්ට අදාළ ගිණුම්කරණ සංකල්ප සඳහන් කරන්න.

i) පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු වටිනාකම තොග වශයෙන් වාර්තා කිරීම.

ii) වාර්ෂිකව ක්ෂය වීම අය කිරීම.

iii) එක් එක් වර්ෂය අවසානයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම.

(ලකුණු 06)

**(මුළු ලකුණු 10)**

ප්‍රශ්න අංක 02

පෙරේරා මහතා 2026 ජනවාරි 1 වන දින නව ව්‍යාපාරයක් ආරම්භ කළේය. 2026 ජනවාරි මාසය තුළ පහත සඳහන් ගනුදෙනු සිදු කර ඇත.

| අංකය | දිනය | ගනුදෙනුව |
|---|---|---|
| 01 | 1 ජනවාරි 2026 | ව්‍යාපාරය ආරම්භ කර ඇත්තේ රුපියල් ලක්ෂ 5 ක් මුදලින් සහ රුපියල් 6,000,000 ක් වටිනා ගොඩනැගිලි ආයෝජනය කරමින්ය. |
| 02 | 2 ජනවාරි 2026 | සමාගමේ මුදලින් රුපියල් 350,000 ක් තැන්පත් කර බැංකු ගිණුමක් ආරම්භ කර ඇත. |
| 03 | 4 ජනවාරි 2026 | ව්‍යාපාරය සඳහා රුපියල් 2,500,000 බැංකු ණය ලබා ගැනීම. |
| 04 | 6 ජනවාරි 2026 | රුපියල් 1,500,000 ක් වටිනා තොග ABC සමාගමෙන් මිලදී ගන්නා ලදී. රුපියල් ලක්ෂ 8 ක් චෙක්පතක් මගින් ගෙවා ඇති අතර ඉතිරිය මාසයක් ඇතුළත ගෙවිය යුතුය. |
| 05 | 8 ජනවාරි 2026 | රුපියල් 800,000 ක් වටිනා තොග රුපියල් 1,000,000 ක මුදලකට විකුණා ඇත. |
| 06 | 15 ජනවාරි 2026 | 25% ලාභාන්තිකයක් තබා ගනිමින් රු, 450,000 ක් වටිනා භාණ්ඩ XYZ සමාගමට විකුණා ඇත. |
| 07 | 10 ජනවාරි 2026 | පෙරේරා මහතා රුපියල් 25,000 ක් වටිනා භාණ්ඩ සිය පෞද්ගලික භාවිතය සඳහා ගෙන ඇත. |
| 08 | 20 ජනවාරි 2026 | XYZ සමාගම රුපියල් 20,000 ක් වටිනා භාණ්ඩ ආපසු ලබා දුන්නේය. මෙම තොගයේ පිරිවැය රුපියල් 16,000 කි. |
| 09 | 24 ජනවාරි 2026 | XYZ සමාගමෙන් රුපියල් 250,000 ක් ලැබී ඇත. |
| 10 | 25 ජනවාරි 2026 | 2021 ජනවාරි මාසය සඳහා රු.300,000 ක් කාර්ය මණ්ඩල වැටුප ලෙස ගෙවන ලදී. |
| 11 | 28 ජනවාරි 2026 | ABC සමාගමට ගෙවිය යුතු ශේෂයෙන් 50% ක් චෙක්පතක් මගින් ගෙවනු ලැබීය. |
| 12 | 31 ජනවාරි 2026 | චෙක්පත් මගින් පහත සඳහන් ගෙවීම් සිදු කරන ලදී.<br>සමාගමේ විදුලි බිල්පත: රු. 12,000<br>සමාගමේ දුරකථන බිල්පත: රු. 8,500<br>පෙරේරා මහතාගේ නිවසේ විදුලි බිල්පත: රු. 6,000 |

ඔබ කළ යුතු වන්නේ,

පහත සඳහන් ගිණුම්කරණ සමීකරණය මත ඉහත ගනුදෙනුවල බලපෑම සටහන් කරන්න.

වත්කම් = වගකීම් + හිමිකම් + ආදායම - වියදම්

**(මුළු ලකුණු 15)**

**ප්‍රශ්න අංක 03**

ආකෘති සහ ආකාෂ් 3:2 ප්‍රතිශතයකින් ලාභ බෙදා ගන්නා හවුල්කරුවන්ග පහත සඳහන් ශේෂය පිරිසුම 2025 දෙසැම්බර් 31 වන දින ඔවුන්ගේ පොත් වලින් උපුටා ගන්නා ලදී.

**2025 දෙසැම්බර් 31 වන දිනට ශේෂය පිරිසුම**

| | රු. | රු. |
|---|---|---|
| ප්‍රාග්ධනය - ආකෘති | | 65,000.00 |
| ප්‍රාග්ධනය - ආකාෂ් | | 40,000.00 |
| ගැනිලි - ආකෘති | 4,000.00 | |
| ගැනිලි - ආකාෂ් | 3,000.00 | |
| කීර්තිනාමය | 10,000.00 | |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 40,000.00 | |
| කාර්යාල ගෘහ භාණ්ඩ | 5,000.00 | |
| මිලදී ගැනීම් | 85,000.00 | |
| විකුණුම් | | 160,000.00 |
| විවිධාකාර ණයගැතියන් | 40,500.00 | |
| විවිධාකාර ණයහිමියන් | | 14,510.00 |
| ආපසු එවුම් සහ ආපසු යැවුම් | 1,500.00 | 2,500.00 |
| කුලියට | 3,750.00 | |
| තැපැල් සහ විදුලි පණිවුඩ | 500.00 | |
| ඉදිරියට කළ වෙළඳ ප්‍රවාරණ වියදම් | 9,000.00 | |
| ආරම්භක තොග | 11,500.00 | |
| අතැති මුදල් | 16,000.00 | |
| වැටුප් | 14,000.00 | |
| දුරකථන ගාස්තු | 500.00 | |
| කාර්ය මණ්ඩලයට වැටුප් | 12,250.00 | |

| | | |
|---|---|---|
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 750.00 | |
| කොමිස් | 5,000.00 | |
| ගමන් වියදම් | 2,000.00 | |
| ගෙන ඒමේ කුලී | 5,800.00 | |
| මෝටර වෑන් | 20,860.00 | |
| ගෙවිය යුතු බිල්පත් | | 8,900.00 |
| | **290,910.00** | **290,910.00** |

**අමතර තොරතුරු**

පහත සඳහන් ගැලපුම් සිදු කළ යුතුය:

i) 2025 දෙසැම්බර් 31 වන දින තොග වටිනාකම රු. 12,500 කි.

ii) කාර්යාල ගෘහ භාණ්ඩ සඳහා ක්ෂය වීම රු. 250 ක් වන අතර කම්හල සහ යන්ත්‍රෝපකරණ සඳහා 10% ක් සහ මෝටර් වෑන් සඳහා 20% ක් ක්ෂය වේ.

iii) වෙළඳ දැන්වීම් වියදම්වලින් 1/5 ක් කපා දමන්න.

iv) හවුල්කරුවන්ට වාර්ෂිකව 5% ක ප්‍රාග්ධන පොලියක් හිමි වන අතර ආකාෂ්ට වාර්ෂිකව රුපියල් 1,800 ක වැටුපක් හිමි වේ.

2025 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා ලාභ හා අලාභ ප්‍රකාශය සහ එම දිනය වන විට මූල්‍යය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය සකස් කළ යුතුය.

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 04**

2025 දෙසැම්බර් 31 වන දිනට මෙගා පොදු සමාගමේ හි ශේෂය පිරිසුම පහත පරිදි වේ.

| | රු. '000 | |
|---|---|---|
| | හර | බැර |
| දේපළ, පිරියත සහ උපකරණ - පිරිවැය | | |
| ඉඩම් | 250,000 | |
| ගොඩනැගිලි | 125,000 | |
| ගෘහ භාණ්ඩ සහ උපකරණ | 85,800 | |
| මෝටර් රථ | 75,600 | |
| 2025 ජනවාරි 1 වන දිනට සමුච්චිත ක්ෂය | | |
| ගොඩනැගිලි | | 85,000 |

| | | |
|---|---|---|
| ගෘහ භාණ්ඩ සහ උපකරණ | | 56,500 |
| මෝටර් රථ | | 27,800 |
| 2025 ජනවාරි 1 වන දිනට තොග | 44,500 | |
| ගෙවිය යුතු ආදායම් බදු | 750 | |
| වෙළඳ ලැබිය යුතු / වෙළඳ ගෙවිය යුතු මුදල් | 261,240 | 147,389 |
| ආයෝජන | 50,000 | |
| බැංකු මුදල් | 21,280 | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (කොටස් 40,000) | | 400,000 |
| රඳවා තබා ගත් ඉපැයීම් | | 147,956 |
| මිලදී ගැනීම් / විකුණුම් | 412,795 | 829,070 |
| පරිපාලන වියදම් | 173,672 | |
| විකිණීම සහ බෙදාහැරීමේ වියදම් | 186,503 | |
| මූල්‍ය පිරිවැය | 6,575 | |
| | **1,693,715** | **1,693,715** |

අමතර තොරතුරු

i) 2025 දෙසැම්බර් 31 වන විට පැවති තොග පිරිවැය රු. 31,570,000 කි. අවසාන තොගයේ අපේක්ෂිත විකුණුම් මිල රු. 32,525,000 ක් වන අතර අදාළ විකුණුම් පිරිවැය රු. 27,000 කි.

ii) සමාගම 2025 ජූලි 1 වන දින වසර දෙකක ස්ථාවර තැන්පතුවක් සඳහා රුපියල් 50,000,000 ක් වාර්ෂිකව 12% ක අනුපාතයකින් ආයෝජනය කර ඇත. කෙසේ වෙතත් වත්මන් මූල්‍ය වර්ෂය සඳහා පොලී ආදායම හඳුනාගෙන නොතිබුණි.

iii) දේපල පිරියත සහ උපකරණ පහත පරිදි ක්ෂය කළ යුතුය.

   a. ගොඩනැගිලි: අවුරුදු 50
   b. ගෘහ භාණ්ඩ සහ උපකරණ: අවුරුදු 10
   c. මෝටර් රථ අවුරුදු 6

iv) සමාගම 2025 දෙසැම්බර් 31 වන දින (2007 දෙසැම්බර් 31 වන දින මිලදී ගත්) ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කළ අතරල එහි අගය රු. 440 මිලියනක් ලෙස ගණනය විය (එයින් 40% ක් ගොඩනැගිලි සඳහා අදාළ වේ). තවද, එම වත්කමේ ඵලදායී ජීව කාලය වෙනස් නොවනු ඇතැයි තක්සේරු කරන ලදි. ප්‍රත්‍යාගණනය කිරීම් මත මූල්‍ය ප්‍රකාශනවල කිසිදු ගැලපීමක් සිදුකර නැත.

v) නොවැම්බර් සහ දෙසැම්බර් මාස සඳහා උපයෝගිතා වියදම් සම්බන්ධයෙන් වූ සත්‍ය වියදම් විස්තර පසුව ලැබී ඇත. එම මුදල රු. 257,000 ක් වේ. එහෙත් සමාගම මෙම වියදම් උපචිත වියදම් ලෙස හඳුනා ගෙන නොමැත.

vi) පසුගිය මූල්‍ය වර්ෂය සඳහා සමාගම රු. 12,000,000 ක බදු වෙන්කිරීමක් (tax provision) සිදු කර ඇත. නමුත් අවසාන බදු ගෙවීමේදී සමාගම ගෙවා ඇත්තේ රු. 12,750,000 ක් වන අතර, එම වෙනස ශේෂ පිරික්සුම තුළ ගෙවිය බදු / ලැබිය යුතු බදු ගිණුමේ පෙන්වා තිබේ. වර්තමාන වර්ෂය සඳහා සමාගම ඇස්තමේන්තු කර ඇති බදු වගකීම රු. 12,522,000 ක් වේ.

vii) සමාගම 2025 දෙසැම්බර් 31 වන දින ලොරි රථයක් ලබා ගැනීම සඳහා කල්බදු ගිවිසුමකට (lease agreement) එක්විය. කල්බදු ගිවිසුමේ කාලසීමාව අවසන් වූ පසුල එම ලොරිය සමාගමට හිමි වේ.

a. කල්බදු කාලය: අවුරුදු 6
b. වාර්ෂික ගෙවීම් වටිනාකම: රු. 1,672,866 (2026 දෙසැම්බර් 31 සිට ගෙවිය යුතුය)
c. කුලී ගිවිසුම තුළ අර්ථ දැක්වෙන පොලී අනුපාතයථ වාර්ෂිකව 13.75%
d. වත්කමේ ඵලදායී ජීව කාලය: අවුරුදු 7

කෙසේ වෙතත්, මෙම කල්බදු ගිවිසුම සම්බන්ධයෙන් ගිණුම් පොත්වල කිසිදු වාර්තාවක් සිදු කර නොමැත.

අවශ්‍ය වන්නේ:

අ) 2025.12.31න් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය.

ආ) 2025.12.31න් අවසන් දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය.

ඇ) 2025.12.31න් අවසන් වර්ෂය සඳහා අවශ්‍ය ගිණුම් සටහන්.

**(මුළු ලකුණු 40)**

**ප්‍රශ්න අංක 05**

නිමල් පොදු සමාගමේ මූල්‍ය ප්‍රකාශනයෙන් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

| 2024.03.31 න් අවසන් වර්ෂය සඳහා | රු. '000 |
|---|---|
| විකුණුම් | 9,000 |
| දළ ලාභය | 3,200 |
| මෙහෙයුම් වියදම් | 1,200 |
| පොලී වියදම් | 200 |
| වර්ෂය සඳහා ආදායම් බදු වියදම් | 450 |
| සාමාන්‍යය කොටස් හිමියාට ගෙවන ලද අතුරු ලාභාංශ | 300 |

| | |
|---|---|
| 31.03.2024 වන විට | |
| තොග | 1,100 |
| වෙළඳ ණයගැතියන් | 1,400 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍යය කොටස (කොටස් සංඛ්‍යාව - 150,000) | 3,000 |

අමතර තොරතුරු:

i) සියලුම විකුණුම් ණය පදනම මත සිදු කෙරේ.

ii) 01.04.2023 වන විට තොග 900,000 ක් විය.

iii) 2023.04.01 වන විට වෙළඳ ණයගැතියන් 1,600,000 ක් විය.

iv) 2021.03.31 න් අවසන් වන වර්ෂය සඳහා තෝරාගත් අනුපාත කිහිපයක් පහත පරිදි වේ.

a. දළ ලාභ අනුපාතය 38%

b. ශුද්ධ ලාභ අනුපාතය 12.5%

c. තොග පිරිවැටුම් අනුපාතය 6 වතාවක්

d. ණයගැති පිරිවැටුම් අනුපාතය 5.5 ගුණයක්

e. කොටසක් සඳහා ඉපැයීම් රු. 7.50

f. කොටසක් සඳහා ලාභාංශ රු. 2.50

අවශ්‍ය වන්නේ:

2024.03.31 න් අවසන් වර්ෂය සඳහා පහත දැක්වෙන අනුපාතයන්.

i) දළ ලාභ අනුපාතය

ii) ශුද්ධ ලාභ අනුපාතය

iii) තොග පිරිවැටුම් අනුපාතය

iv) ණයගැති පිරිවැටුම් අනුපාතය

v) කොටසකට ඉපැයීම් (EPS)

**(මුළු ලකුණු 15)**